Fungal - ආසාදනය



# බිළිඳුන්ගේ **Candida** අක්කාරම

## වැදගත් කරුණු

- මුඛයේ ඇතිවන **candida** ප්‍රතිජීවකයක් **(antibiotic)** නිසා හට ගනී.
- දැනටමත් දැවිල්ල හට ගෙන ඇති සමේ **candida** හටගනී
- ස්නානයෙන් පසුව සමේ හැකුලුනු තැන් සැළක්ල්ලෙන් වියලි කරන්න.
- හැකි සෑම අවස්ථාවකම ප්ලාස්ටික් පැනටි හෝ නැපී පාවිච්චි කිරීමෙන් වළක්න්න.
- සමේ ඇතිවන **candida** වලට වෛද්‍යවරයකු විසින් නියම කරණ ලද ප්‍රතිකාරය **cortisone** ක්‍රීම් වරග සහ පිළියෙල කරණ ලද නිස්චිත ප්‍රති **candida** යන දෙකම අඬංගුවේ.
- එය මුඛයේ හටගත් විට ප්‍රති **candida** ජෙලි හෝ බිංදු ඇත.
- **Candida** නැපී පදෙසෙන් වළක්වා ගැනීම සඳහා

—නිතරම නැපී මාරු කරන්න

—නැපී පදෙස සෝදා ප්‍රවේසමෙන් තෙත මාත්තු කරන්න

—ඉකිළිය සහ නැපී පදෙසේ සම ආරක්‍ෂාකර ගැනීම සඳහා **paraffin** හෝ **zinc** ක්‍රීම් වැනි තෙතමනය රඳා පවතින  භාධකයක් ආලේප කරන්න.

## එය මොකක්ද?

Yeast Candida albicans වලින් ඇතිවන candida හෝ thrush  සමේ ඇතිවන පොදු ආසාදනයකි (infection). එය මුඛය (oral candida), ඉකිළියේ සම රැලි ගැසෙන තැන්වල,  පිටු පස අවට හෝ ඇතැම්විට කිහිල්ල වැනි උෂ්ණත්වය සහ තෙතමනය ඇති තැන්වල වැඩීමට කැමැත්තක් දක්වයි.

එයින් මුඛයේ, රතු පාට ආශ්‍රිත සුදු සාරය ඇති කුඩා කැබෙලි ලප එකක් හෝ වැඩි ගණනක් ඇති විය හැක. කම්මුලේ ඇතුලත වැස්මේ පොදු වශයෙන් හට ගත්තත් ඇතැම් විට විදුරුමසටත්, තල්ල (උඩු තල්ල) හෝ දිවටත් සම්බන්ධ විය හැක.

ඉකිළියේ හෝ පිටුපස අවට සම හැකිලී ඇති තැන්වල candida ගැඹුරට හට ගනී. ඉන්පසු එය සම හා සම්බන්ධ පදෙස් වලින් ඉවත්වී කලවා සහ තටටම් දක්වා විහිදෙයි. මෙය සාමාන්‍ය සමේ ඇති නොවන බැවින් පොදුවේ candida වලින්  යටි ආධාර ඇතිව ආසාදනයවූ දදයක් (dermatitis) විය හැක.  උෂ්ණත්වය සහ තෙතමනය පවතින නැපී පදෙසේ පොදු දෙයකි. ආසාදනයවූ සමේ වීදුරු සමාන රතු ඔපයක් ගොඩ නැගෙන අතර කෙලවරේ සිවිය ගැලවීම ගටගෙන කුඩා ලකුණු සමේ නැන්  තැන් වලින් විහිදී යයි.

## එවා ඇති වන්නේ කෙසේද?

සාමාන්‍ය ජනගහනයෙන් 20% ක විතර කිසිම ප්‍රශ්ණයක් නැතිව candida මුඛයේ පවතී. ප්‍රතිජීවිකයක්

(antibiotics) ගැනීම වැනි වෙනසක් ඇතිවුව හොත් candida අධික ලෙස වැඩීමක් ඇති විය හැක.

මුඛයේ කෑම රැඳීමට හැරීම (පැණි රස බීම සහ කිරි ඇතුලුව), මුඛ candida වැඩීමට හේතුවේ.

සමේ හැකුලුණු තැන්වල තෙතමනය සහ උෂ්ණත්වය රැඳීම සහ විශේෂයෙන් ශර්ම රෝගයද ඇත්නම් candida ආසාදනය ඇතිවීම බෙහෙවින්ම සිදු විය හැක. සමේ හැකුලුණු තැන්වල චර්ම රෝගය මතුපිට candida වැඩීමක් ඇතිවුව හොත් ප්‍රති Candida ප්‍රථිකාරය නොමැතිව cortisone ක්‍රීම් පමණක් යේදීමෙන් candida උත්සන්නවේ.

## ඒවාට ප්‍රථිකාර කරන්නේ කෙසේද?

නිශ්පිත ප්‍රථි - Candida ප්‍රථිකාරය වන්නේ, නැපි පදෙසට ක්‍රීමයකුත්, මුඛයට ජෙලි සහ බිංදුද වේ. ක්‍රීම් ජාති නිර්දේශය කිරීමේදී චර්ම රෙගයක්ද තිබේ නම් ඊටද සරිලන අන්දමට මෘදු cortisone ක්‍රීමයක්ද ඇතුල් වනු ඇත. මවට යෝනි මාර්ගයේ හෝ තන පුඩුවල candida ඇත් නම් වෛද්‍යවරයකුගෙන් ප්‍රථිකාර ගහයුතුවේ.

## Candida වැඩීම වැළැක්වීම සඳහා ගත යුතු පොදු ක්‍රියා මාර්ගයන් සමහරක් නම්

- ප්‍රථිජීවක හැකි තාක් ඉක්මනට නැවැත්වීම
- ස්නානයෙන් පසුව සමේ හැකුලුණු තැන් සැළකිල්ලෙන් තෙත මාත්තු කිරීම
- අධික උෂ්ණත්වය වැළැක්වීම සඳහා බුරුල් ඇඳුම් පැළඳීම.
- යටපත්වී ඇති චර්ම රෝග හෝ නැපි පළු සඳහා ප්‍රමාණවත් ප්‍රථිකාර ලබා ගැනීම.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖෂධ වේදියා
ඔබේ පවුලේ දොස්තර මයා/මිය
චර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

මීට සම්බන්ධිත තොරතුරු පත්‍රිකාව ඃ Eczema Candida (Thrush) of the Nipple

© 2002, Department of Dermatology, St. Vincent’s Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.